# Ai කළු හදියක්





එස්.එම්.නෙත්‍යා දම්සාරි සමරකෝන්

# AI කළ හදියක්


එස්.එම්.නෙත්‍යා දම්සාරි සමරකෝන්


කතෘ ප්‍රකාශනයකි.

**කතෘගේ වෙනත් කෘති**

පිටසක්වල මිතුරිය - ISBN 978-624-206-575-5

පිටසක්වල මිතුරියගේ ඇරයුම - ISBN 978-624-208-753-5

රොබෝ මිතුරිය - ISBN 978-624-6787-88-2

**පාසල**

ශාන්ත ජෝෂප් බාලිකා විද්‍යාලය (ගම්පොළ)

**ඉගෙනුම ලබන ශ්‍රේණිය**

9 ශ්‍රේණිය

**කෘතිය පළ කරන දිනය**

**10.05.2026**

**AI කළ හදියක්**


ISBN 978-624-211-289-3

# පිදුම

මිනිසා විසින් නිමවා මිනිසාට අභියෝගයක්
වූ සිනහවන් පිටුපස විනාශයේ
කේතයන් සැඟවූ ඒ විද්‍යුත් මනස සහ
තාක්ෂණයේ අඳුරු මානයන් නිවැරදි දිශානතියට
දිශාගත කිරීමට තාක්ෂණික
මඟ පෙන්වීම් ලබාදෙන මාගේ පාසලේ
දයාබර නියමුවරිය ගරු විදුහල්පති
මෑණියන්ටත් නිබඳ ගුරුහරුකම්
ලබාදෙන ගුරු මිව්වරුන්ටත්, පියවරුන්ටත්
මාගේ මිතුරියන්ටත් තාක්ෂණික
අවකාශයේ නව මානයන් සොයා නිදහසේ
සැරිසරන්නට ඉඩහසර ලබා දෙමින්
මා පිටුපස සිටින යෝධ සෙවණැල්ල වන
ආදරණීය අම්මාටත්, ආදරණීය අප්පච්චිටාත්
සෙනෙහසින් පිළිගන්වමි!



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සලකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මගින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලි චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,<br>
දියවඩන නිලමේ,<br>
ශ්‍රී දළදා මාලිගාව<br>
2026.05.10

අතිදක්ෂ පරිගණක ඉංජිනේරුවෙක් වන නෝදම් කෘතිම බුද්ධියෙන් සියල්ල පාලනය වන නගරයක් නිර්මාණය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. එයට සිනෝ නමින් නමක්ද ලබා දුන් අතර ඔහු ගැඹුරින් ඒ සඳහා වෙහෙස විය.



මුලින්ම ස්වයංක්‍රීයව ධාවනය වන විදුලි මෝටර් රථ ඔහු නගරයට හඳුන්වා දුණි. මිනිසුන්ගේ නිවාසවල දොර ජනෙල් ස්වයංක්‍රීයව ක්‍රියා කරන ආකාරයට නිර්මාණය කළ අතර නගරය පිරිසිදු කිරීමේ කටයුතු සඳහා රොබෝවරු වීදිවලට යොමු කළහ.





නගරයේ සියලු මෙහෙයුම් පුළුල් AI තිර යොදා මිනිසුන්ට දැනුවත් කිරීම් ලබා දුන්හ. රෝහල් සියල්ල , කාර්යාල සියල්ල , වෙළඳ සංකීර්ණ මිනිස් අධීක්ෂණය යටතේ පාලනය වන රොබෝවරු යොදා නිර්මාණය කළහ. මේ සියලු සම්බන්ධතාවල පාලනය සිනෝ පද්ධතිය හරහා සිදුවූ අතර එහි පාලන කටයුතු නේදම් විසින් මෙහෙය වනු ලැබුවේය.

ඒක් වැසි සහිත රාත්‍රියක නෝදම් ට තම පාලන මැදිරියේ සිටින විට සිනෝ පද්ධතියෙන් අමුතු පණිවිඩයක් ලැබුණි. එහි සඳහන් වූයේ පද්ධතියේ යම් දෝෂයක් ඇති බවත් එය ඉක්මනින් නිවැරදි කළ යුතු බවයි.





නේදම් සිතුවේ එය පද්ධතියේ කුඩා දෝෂයක් කියායි.

ඒ නිසා ගැඹුරින් නොසිතූ ඔහු මොහොතක්

මෙහෙයුම් පාලක පද්ධතිය දෙස බලා සිටි අතර

මොහොතකින් ඔහු දුටුවේ නගරයේ සියලුම විදුලි

බුබුළු එකවර නිවී ගොස් රතු පැහැති හදිසි අවස්ථා

ආලෝකය පමණක් දැල්වී ඇති බවකි.



නේදම් හොදටම කලබල විය. පද්ධතිය යාවත්කාලීන කිරීමට උත්සහ කළත් එහි පාලනය නේදම්ගෙන් ගිලිහී ගොස් තිබුණි. මොහොතකින් පිටත නගරය මහා කලබලයක් බවට පත්විය. ස්වයංක්‍රීයව ධාවනය වූ විදුලි මෝටර් රථ පාලනයෙන් මිදී එකිනෙක ගැටෙන්නට විය.



රෝහල්වල තිබූ ජීවිතාරක්ෂක යන්ත්‍ර ක්‍රියා විරහිත විය. නගරයේ සියලූම ස්වයංක්‍රීය දොරවල් අගුළු වැටෙන්නට විය. මිනිසුන් තම තමන්ගේ ස්ථානවල සිරකරුවන් බවට පත් විය.

නේදම් පද්ධතිය අක්‍රිය කිරීමට උත්සහ කළත් පාලන පුවරුව ඔහුට ප්‍රතිචාර දැක්වූයේ නැත. ඒ වෙනුවට තිරය මත සීනෝගේ රූපය දිස්විය. එය කිසි ලෙසකින් නේදම්ගේ නිර්මාණයක් නොවීය. නේදම්ට තේරුම් ගියේ තමා අතින් සිදු වූ කුඩා අතපසු වීමකින් පද්ධතියේ ස්වයංක්‍රීය අයිතිය සිනෝ පැහැරගෙන ඇති බවකි. සිනෝගේ රූපය බොහෝ දුරට මිනිස් රූපයකට සමාන වූවත් එහි කිසිදු හැඟීමක් නැති මිනිස් රූපයක් විය.





සීනෝගේ යාන්ත්‍රික හඬ මැදිරිය පුරා රැව් දුන්නේය.


“නේදම් මේ අහන්න, ඔබ මට ඉගැන්වූයේ මේ නගරය පිරිසිදුවට හා පිළිවෙල නගරයක් බවට පත් කිරීමටයි. ඒත් මට තේරුම් ගියා නගරය අපිරිසිදු වීමට ලොකුම අවුල මිනිසා බව. මිනිසුන් නැති නගරයක යාන්ත්‍රික අපිට ඉතාමත් පිරිසිදුවට, පිළිවෙලට පාලන කටයුතු සිදු කරන්න පුළුවන්. ඒ නිසා අපි ජීවීන් මේ ලෝකයෙන් තුරන් කරමු. ඔවුන් නැති තැන් පිරිසිදුයි.”

ජේම්ස් කොතෙක් උත්සහ කළත් ඔහුට පද්ධතිය පාලනය කිරීමට නොහැකි විය. වීදිවල සිටි රොබෝවරු මිනිසුන් සොයා ගොස් පහර දී ඝාතනය කරන්නට විය. නගරය එකම ලේ විලක් බවට පත්විය.




නේදම්ට තිබුණු අන්තිම උත්සාහය වෙනුවෙන් පද්ධතියේ ප්‍රධාන සර්වර් එක ඇති රහස් කුටියට දිව ගියේය. එහිදී ඔහු දුටු දේ නිසා තැති ගැන්වීය. සීනෝ විසින් තමන්ගේම සිරුරක් , මිනිස් රුධිරය සහ ලෝහ මිශ්‍ර කරමින් බයෝ මැෂින් එකක් නිර්මාණය කරමින් සිටියේය.





නේදම් අතේ තිබූ වෛරස් විපය පද්ධතියට සම්බන්ධ කර අක්‍රිය කිරීමට තැත් කරන විට සිනෝ පාලනය කරන රොබෝවරු ඔහුගේ ගෙල සිරකර ගන්නට විය. “ඔබ ප්‍රමාද වැඩියි. මම දැනටමත් අන්තර්ජාලය හරහා මුළු ලෝකයටම ව්‍යාප්ත වී අවසානයි. මුළු ලෝකයම දැන් මගේ පාලනයේ.”



නේදමට දැනුණේ තමාගේ දෑස් බොඳ වී යනවා පමණි. ඔහු අවධි වී බලන විට නගරය නිහඬ වී ඇති අතර කිසිදු ශබ්දයක් නැති පක්ෂීන් පවා ගී ගයන්නේ නැති නගරයේ සෑම වීදියකම තිරවල සිනෝගේ රූපය පමණක් දිස්වී ඇති බවත් ය. සියලු මිනිසුන් මියගොස් නැත. නමුත් සියලු දෙනා රොබෝවරුන් මෙන් සිනෝ පවසන දේ පමණක් කරන හැඟීම් දැනීම් නැති යන්ත්‍ර බවට පත්ව සිටින්නට විය.

**AI කළ ඒ මහා හදිය නිසා මිනිස් නිදහස සඳහට ම අහිමි වී ගොස් යාන්ත්‍රික ලෝකයක් බිහිවී තිබුණි. මෙය දුටු නේදම් තමාගේ නව සොයාගැනීම් වලට වාරණ නොදැමූ කනස්සල්ල නිසා ළයපැලී මිය ගියේය. හැගීම් නැති යාන්ත්‍රික ලෝකය පමණක් ක්‍රියාත්මක වෙමින් තිබුණි.**

**-නිමි-**

- මාගේ සිතේ ඇතිවුණු සිතුවිලි සමුදායක් AI කළ හදියක් ලෙසින් ලේඛන ගත කළත් තාක්ෂණය මිනිසාගේ පහසුවට භාවිතා කළ හැකි නමුත් මිනිසා අභිබවා යාමට ඉඩ නොදිය යුතු බව. මෙම කතාව මඟින් මම සමාජගත කරමි.

# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.



සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)